# සමාජවාදී සමානතා පක්ෂයේ ව්‍යවස්ථාව

## 1. අරමුන

අ. ධනවාදය බිඳ හෙලීම, කම්කරු පන්තියේ බලය පිහිටුවීම හා සමාජවාදී සමාජයක් ගොඩනැගීම සඳහා කම්කරු පන්තිය සංවිධානය කිරීම හා සටනට මෙහෙයැවීම සමාජවාදී සමානතා පක්ෂයේ අරමුනයි.

ආ. ලෙනින් හා ට්‍රොට්ස්කි විසින් වැඩි දියුනු කරන ලද මාක්ස්වාදී න්‍යාය මත ද කොමියුනිස්ට් ජාත්‍යන්තරයේ ප්‍රථම සම්මේලන හතරේ තීන්දු හා හතරවැනි ජාත්‍යන්තරයේ මූලික ක්‍රියා මාර්ගය මත ද සමාජවාදී සමානතා පක්ෂයේ තම ප්‍රතිපත්ති පදනම් කරයි.

ඇ. හතරවැනි ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුව සම්බන්ධ වූ ද හතරවැනි ජාත්‍යන්තරය ගොඩනැගීම සඳහා සටන්වදින්නා වූ ද හතරවැනි ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ලංකා ශාඛාව සමාජවාදී සමානතා පක්ෂය යි.

## 2. සාමාජිකත්වය

අ. සමාජවාදී සමානතා පක්ෂයේ ක්‍රියාමාර්ගය ප්‍රතිපත්ති හා ව්‍යවස්ථාව පිලිගන්නා වූත් එහි ජාතික සංවිධානයන්ගේ හා නියමිත ප්‍රාදේශීය සංවිධානයන්ගේ නායකත්වය යටතේ ක්‍රියාකිරීමට හා සාමාජික මුදල් ගෙවන්නට සූදානම් වූත් ඕනෑම තැනැත්තෙකු සාමාජිකත්වය ලැබීමට සුදුසුය.

ආ. සමාජවාදී සමානතා පක්ෂයේ සාමාජිකයින් සුදුසු වෘත්තීය සමිතිවල සාමාජිකයින් විය යුතු අතර ජාතික සම්මේලනයේ හා මධ්‍යම කාරක සභාවේ තීරනයන්ට අනුකූලව අනෙක් කම්කරු පන්ති සංවිධානයන් තුල ද ක්‍රියා කල යුතු ය.

## 3. ශාඛා:

අ. ප්‍රදේශය හෝ වැඩ කරන ස්ථානය මත පදනම් වූ යටත් පිරිසෙයින් පූර්න සාමාජිකයින් තිදෙනෙකුගෙන් යුක්ත වූ සමාජවාදී සමානතා පක්ෂයේ මූලික ඒකකය ශාඛාව ය. අනෙකුත් සංවිධාන තුල ක්‍රියා කිරීම ද ඇතුලුව සිය සාමාජිකයින්ගේ සියලුම වැඩ පාලනය කිරීමේ වගකීම එය සතුය.

ආ. සෑම ශාඛාවක්ම යටත් පිරිසෙයින් වසරකට වරක් වත් තම නිලධාරීන් තෝරා පත් කර ගත යුතු අතර මේ නිලධාරීන් රැස්වීම් දෙකක් අතර තුර කාලයේ දී ශාඛාවේ වැඩ ගැන වග කියන ශාඛා කමිටුවේ සාමාජිකයින් වනු ඇත. ශාඛාවේ ප්‍රතිපත්තිමය තීරන ගන්නේ ශාඛා රැස්වීම් පමනකි.

## 4. ජාතික සම්මේලනය:

අ. සාමාජිකත්වය නියෝජනය කරන්නා වූ නියෝජිතයන්ගෙන් සමන්විත ජාතික සම්මේලනයක් යටත් පිරිසෙයින් වසරකට වරක් වත් කැඳවන අතර එය සමාජවාදී සමානතා පක්ෂයේ උසස්ම බල මන්ඩලයයි.

ආ. නියෝජිතයින් තෝරනු ලබන්නේ සෑම සාමාජිකයින් තිදෙනෙකුට ම එක් අයෙකු වශයෙනි. එයින් වැඩි වන තුනකට නොඅඩු කන්ඩායමක් සඳහා ද එක් නියෝජිතයෙකු බැගින් තෝරා ගනු ලැබේ. සෑම සාමාජිකයෙකු ම යටත් පිරිසෙයින් එක් නියෝජිතයෙකු වත් තෝරා පත් කර එවිය යුතු ය.

ඇ. ජාතික සම්මේලනයට සහභාගි වන පූර්න බල ඇති සාමාජිකයින් සියල්ලන්ට ම නිදහස්ව ඡන්දය පාවිච්චි කිරීමේ අයිතිය ඇත.

ඈ. සරල වැඩි ඡන්දයෙන් ජාතික සම්මේලනයේ තීරන ගනු ඇත.

ඉ. ශාඛාවන්ගේ හෝ සාමාජිකත්වයේ 1/3 ක ඉල්ලීම පිට, ශාඛාවන්ගේ වාර්තාගත කරන ඡන්දයක් මාර්ගයෙන් විශේෂ ජාතික සම්මේලනයක් කැඳවිය හැකිය.

ඊ. ව්‍යවස්ථාව සංශෝධනය කල හැක්කේ ජාතික සම්මේලනයට පමනකි.

උ. සියලුම සාමාජිකයින්ට යටත් පිරිසෙයින් සම්මේලනයට සති අටකට පෙරාතුව ප්‍රතිපත්තිමය යෝජනාවන්ගේ කෙටුම්පත් බෙදා හැර මධ්‍යම කාරක සභාව විසින් බෙදා හැර සම්මේලන සාකච්ඡාව ආරම්භ කෙරෙනු ඇත. ශාඛා විසින් හෝ ශාඛාවකින් 1/3ක හෝ ඊට වැඩි ගනනක සාමාජිකයින් කන්ඩායමක් විසින් හෝ සම්මේලනයට සති තුනකට පෙර හෝ දක්වා ඉදිරිපත් කරන යෝජනා හා ව්‍යවස්ථාවට හා මූලික ලියවිල්ලට ඉදිරිපත් කෙරෙන සංශෝධන ද මධ්‍යම කාරක සභාව විසින් ශාඛාවන්ට බෙදා හරිනු ඇත. අනෙකුත් යෝජනා හා සංශෝධන සම්මේලනය දක්වා ම හා එහි දී මත් ඉදිරිපත් කල හැකි ය.

## 5. මධ්‍යම කාරක සභාව සහ දේශපාලන කමිටුව

අ. පූර්න හා අතිරේක සාමාජිකයන්ගෙන් යුතු මධ්‍යම කාරක සභාවක් පහත සඳහන් ආකාරයට ජාතික සම්මේලනය විසින් තෝරා පත් කර ගනු ඇත. ඉවත්ව යන මධ්‍යම කාරක සභාව විසින් පත් කරන එක් සාමාජිකයෙකුගෙන් ද මධ්‍යම කාරක සභිකයන් නොවූ සම්මේලනයේ දී කෙලින් ම පත් කරගන්නා සාමාජිකයන් දෙදෙනෙකුගෙන් ද යුතු කමිටුවක් සම්මේලනය විසින් පත් කරගනු ඇත. මධ්‍යම කාරක සභාව ශාඛාවන් හා සාමාජිකයන් විසින් යෝජනා කර ඇති පුද්ගලයින්ගෙන් මේ කමිටුව විසින් අපේක්ෂකයින්ගේ නම් ලැයිස්තුවක් සකසනු ඇත. මෙයට ඉදිරිපත් කරන සංශෝධන පිලිබඳව කෙරෙන ඡන්ද විමසීමකින් පසුව සම්මේලනයේ ඒ ලැයිස්තුව ගැන ඡන්ද විමසනු ඇත. අපේක්ෂකයින්ගේ ලැයිස්තුවට අමතරව ඉදිරිපත් වූ සියලුම නම් ගැන තාවකාලික කමිටුව වාර්තා කරනු ඇත.

ආ. නියෝජිතයින් අතර එයට ඇති සහයෝගයට අනුපාතව අඩු පක්ෂයකට මධ්‍යමකාරක සභාවේ අසුන් හිමි විය යුතු අතර මේ සඳහා මධ්‍යම කාරක සභාව තෝරන කමිටුවේ අපේක්ෂකයින් ලැයිස්තුවේ ඉඩ සැලසිය යුතුව ඇත.

ඇ. මධ්‍යම කාරක සභාව විසින් දේශපාලන කමිටුවක් හා අවශ්‍ය වූ විට වෙනත් කමිටු ද පත් කර ගනු ඇත.

ඈ. මධ්‍යම කාරක සභා දෙකක් අතරතුර කාලයේ දී මධ්‍යම කාරක සභාව සතු සියලු බලතල දේශපාලන කමිටුව විසින් දරනු ලැබේ. දේශපාලන කමිටුව යටත් පිරිසෙයින් මසකට වරක් වත් රැස් විය යුතු අතර මධ්‍යම කාරක සභාවට වග කියන්නට බැඳී සිටී. එය තම වැඩ ගැන මධ්‍යම කාරක සභාවට වග කියයි.

ඉ. ජාතික සම්මේලනයන් අතර කාලයේ දී මුලු බලය මධ්‍යම කාරක සභාව සතු ය. එය ජාතික සම්මේලනයේ දී තීරනය කල ප්‍රතිපත්ති ක්‍රියාත්මක කරනු ඇති අතර සමාජවාදී සමානතා පක්ෂය වැඩි දියුනු කිරීමට අවශ්‍ය තීරන ගනු ඇත. එය යටත් පිරිසෙයින් තෙමසකට වරක් වත් රැස් විය යුතු අතර මධ්‍යම කාරක සභාව සිතන්නේ නම් ඊට වඩා ඉක්මනින් රැස්වනු ඇත.

ඊ. නොපැමින ඇති පූර්න සාමාජිකයකු නියෝජනය කරන විටෙක දී හැර අන් අවස්ථාවන් හි දී ඒ අතිරේක සාමාජිකයින්ට මධ්‍යම කාරක සභා තීරන ගැනීමේ දී ඡන්දය පාවිච්චි කල නොහැක.

## 6. මුදල් දීමනා:

අ. සාමාජිකයන්ගේ සාමාජික මුදල් ඒ ඒ සාමාජිකයාගේ මුදල් තත්වය අනුව තීරනය කරනු ඇත. වඩා අඩු මුදලක් අය කල යුතු යැයි ශාඛාව අදහස් කරන අවස්ථාවන් හි දී හැරෙන්නට අවම සාමාජික මුදල මසකට රු.10 වනු ඇත.

ආ. ප්‍රාදේශීය ශාඛාවේ අදහස් අනුව සාමාජික මුදල් නොගෙවා තිබීමට විශේෂ හේතුන් නොමැත්තේ නම් මාස තුනකට වඩා සාමාජික මුදල් නොගෙවා තිබීමෙන් සාමාජිකත්වය අහිමි වේ.

ඇ. සාමාජික මුදල් නොගෙවා තිබීමට විශේෂ හේතු තිබේ යැයි ප්‍රාදේශීය ශාඛා අදහස් කල හොත් හැර ජාතික සම්මේලනයකට නියෝජිතයන් ලෙස පත් කර ගත හැක්කේ සම්පූර්නයෙන් මුදල් ගෙවා ඇත්තවුන් පමනකි.

ඈ. සංවිධානයේ ක්‍රියාකාරීත්වය සඳහා අවශ්‍යයයි හැඟෙන මුදල් එකතු කිරීම් කරන්නට මධ්‍යම කාරක සභාවට බලය ඇත.

## 7. ප්‍රජාතන්ත්‍රවාදී අයිතිවාසිකම්:

අ. යම් සංවිධානයක වැඩි ඡන්දයෙන් ගනු ලබන තීරනයකට එයට සම්බන්ධ වූ සියලුම සාමාජිකයෝ බැඳී සිටිති.

ආ. තීරනය ක්‍රියාවට පෙරළීමේ දී වැඩි කන්ඩායම් හා එක්ව සහයෝගයෙන් ක්‍රියා කරන අතර ම විකොස තුල වෙනත් අදහස් ප්‍රකාශ කිරීමට හා සංවිධානය වීමටත් ඒ අදහස් අඩංගු ලිපි ද්‍රව්‍ය මධ්‍යම කාරක සභාව තුලින් සාමාජිකයන්ට ලැබෙන්නට සැලැස්වීමටත් තමන් එකඟ නොවන තීරන සම්බන්ධයෙන් ඉහල මන්ඩල වලට ආයාචන කිරීමටත් ඕනම අඩු කන්ඩායමකට අයිතිය ඇත. එබඳු වෙනත් අදහස් ප්‍රචලිත කිරීමේ මාධ්‍යය ලෙස අභ්‍යන්තර නිවේදන පත්‍රිකාව පාවිච්චි කෙරෙනු ඇති අතර ඉල්ලා සිටිය හොත් සාකච්ඡා සඳහා ඉදිරිපත් කරන ලිපි ද්‍රව්‍ය ඒවා ලැබීමෙන් දින 21ක් ඇතුලත ප්‍රසිද්ධ කරනු ඇත.

අඩු කොටසක් ලෙස ක්‍රියා කිරීම සඳහා අනුගමනය කල යුතු ක්‍රියාමාර්ගය මෙසේ ය. මධ්‍යම කාරක සභිකයෙක් නම් එයට තමන්ගේ වෙනස්කම් දක්වන ලියවිල්ලක් ඉදිරිපත් කරනු ඇත. දේශපාලන කමිටුවේ සාමාජිකයෙක් ප්‍රථමයෙන් දේශපාලන කමිටුව තුල ද දෙවැනුව අවශ්‍ය නම් මධ්‍යම කාරක සභාව සමග ද තම වෙනස්කම් සාකච්ඡා කරනු ඇත. මෙම සාකච්ඡාවලින් පසුවත් ඒ සහෝදරයාගේ වෙනස්කම් පවතින්නේ නම් ඔහුට සංගමය තුල ම තම අදහස් සඳහා සහයෝගය පැතීමට අයිතිය ඇත.

## 8. විනය

අ. විනය කඩ කරන හෝ සමාජවාදී සමානතා පක්ෂයේ හා කම්කරු පන්තියේ උවමනාවන්ට හානි කරන අන්දමින් ක්‍රියාකරන ඕනෑම සාමාජිකයෙකුට විරුද්ධව අප්‍රසාදය පල කිරීම, තෙමසකට නොවැඩි කාලයකට සාමාජිකත්වය තහනම් කිරීම හා සාමාජිකත්වයෙන් ඉනරපා හැරීම ඇතුලුව විනයානුකූල පියවරයන් ගැනීමට ඔහු අයත්වන සංවිධානයට පුලුවන. ශාඛාවන් විසින් කරනු ලබන නෙරපා හැරීම්වලට දේශපාලන කමිටුවේ හෝ මධ්‍යම කාරක සභාවේ අනුමැතිය අවශ්‍ය වේ.

ආ. තමන්ට විරුද්ධව විනයානුකූලව ක්‍රියා කිරීමට පෙර, පරීක්ෂනයක් ඉදිරියේ පෙනී සිටීමට හා තමන් ගේ ක්‍රියා කලාපය ගැන කරුනු ඉදිරිපත් කිරීමටත් සාමාජිකයෙකුට අයිතිය ඇත. විනයානුකූල චෝදනා ඉදිරිපත් කරන ඕනෑම සාමාජිකයෙකුට ඔහුට විරුද්ධව ඇති චෝදනාවන් ගැන ලියවිල්ලකින් දැන්විය යුතු ය.

ඇ. විනයානුකූල පියවරයන් ගනු ලබා ඇති ඕනෑම සාමාජිකයෙකුට, දේශපාලන කමිටුවට, මධ්‍යම කාරක සභාවට හෝ ජාතික සම්මේලනයට ලිවීමෙන් හා දේශපාලන කමිටුව, මධ්‍යම කාරක සභාව හා සම්මේලනයෙන් පත් කෙරෙන කමිටුවක් ඉදිරියේ පුද්ගලිකව පෙනී සිටීමෙන් ආයාචනා කිරීමටත් විකොස තුල තමන්ගේ ආයාචනයට අදාල ලිපි ද්‍රව්‍යය ඉදිරිපත් කිරීමටත් ඒවා ඉදිරිපත් කිරීමෙන් දින 21ක් ඇතුලත මධ්‍යම කාරක සභාව මගින් බෙදා හරවා ගැනීමටත් අයිතියක් ඇත. ඒ කාලය තුල ද විනයානුකූල පියවර වලංගුය.

ඈ. මධ්‍යම කාරක සභාවේ සාමාජිකයන් නොවූ සාමාජිකයින් තිදෙනෙකුගෙන් සමන්විත පරීක්ෂන මන්ඩලයක් ජාතික සම්මේලනය විසින් පත් කර ගනු ලැබේ. මධ්‍යම කාරක සභාව හෝ දේශපාලන කමිටුව අවශ්‍ය යැයි සිතන පරීක්ෂන කරගෙන යෑමටත් යම් සාමාජිකයෙකු ඉදිරිපත්කරන පැමිනිල්ලක් ගැන සොයා බැලීමටත් පරීක්ෂන මන්ඩලයට බලය ඇත. ඒ ගැන තමන්ගේ සොයාගැනීම් දේශපාලන කමිටුව හෝ මධ්‍යම කාරක සභාවට අවශ්‍ය පියවර ගැනීම සඳහා ඉදිරිපත් කෙරෙනු ඇත. පරීක්ෂන මන්ඩලය ජාතික සමුලුවට වග කියන අතර ම තම ක්‍රියාවන් ගැන එයට වාර්තා කරනු ඇත.

ඉ. සමාජවාදී සමානතා පක්ෂයේ නොවන අය සමග ගෙන යන දේශපාලන සම්බන්ධතා සියල්ලම වාර්තා කල යුතු අතර ඒ ගනුදෙනුවලට අදාල වන්නා වූ කටයුතු පක්ෂයේ පූර්න පාලනය යටතේ සිදුවිය යුතු ය.

ඊ. සංගමයේ ආරක්ෂාව අඩාල වීම පිලිබඳ ප්‍රශ්නයන් පැන නැග ඇතැයි මධ්‍යම කාරක සභාව ඒත්තු ගන්නා ඕනෑම අවස්ථාවක දී කිසියම් සාමාජිකයකුගේ සාමාජිකත්වය දෙමසකට නොවැඩි කාලයක් සඳහා තහනම් හෝ සාමාජිකයෙකුට අනිවාර්ය නිවාඩු ලබා දෙන්නට මධ්‍යම කාරක සභාවට බලය පවතී. ඒ කාලය තුල ද කෙරෙන පරීක්ෂනයේ ප්‍රතිඵලය උඩ මධ්‍යම කාරක සභාව ඒ සාමාජිකයා ගැන තීන්දුවක් නොගන්නේ නම් දෙමාසය අවසානයේ දී ඔහු හෝ ඇය යලිත් වරක් කලින් පක්ෂය තුල දැරූ තත්වයට ම පැමිනේ.

## 9. ප්‍රකාශන

අ. සමාජවාදී සමානතා පක්ෂයේ සියලුම ප්‍රකාශන මධ්‍යම කාරක සභාවේ බලතල හා පාලනය යටතේ නිකුත් කරනු ඇත. අභ්‍යන්තර න්‍යායික හා දේශපාලන සාකච්ඡාවන් සඳහා මධ්‍යම කාරක සභාවේ නිවේදන පවත්වා ගෙන යනු ඇත. ඉදිරිපත් කරන ලිපි ද්‍රව්‍ය හැකිතාක් ඉක්මනින් ප්‍රසිද්ධ කරනු ඇත.